**ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය පිළිබඳ තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මගී වාහනවල වටිනාකම රු.238,450,000 ක් ලෙස සඳහන් වුවද විගණනයට ඉදිරිපත් කළ වාහන උපලේඛනය අනුව මගී වාහන 54 ක වටිනාකම රු.236,950,000 ක් වූයෙන් රු.1,500,000 ක වෙනසක් විය. | වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම් ගත කළ යුතුවීම. | වෙනස නිවැරදි කිරීම සඳහා මගී වාහන 54 ක වටිනාකම ගත් මිල අනුව 2019 ජුනි 30ට පෙර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වෙනත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම වාහනවල වටිනාකම හැර රු.165,831,207ක් වුවද ප්‍රධාන ලෙජර් ශේෂය අනුව රු.162,377,254 ක් වූයෙන් රු.3,453,953 ක වෙනසක් විය. | මිලදීගැනීම් අදාල කාලපරිච්ඡේදයේදි ගිණුම් ගත කළ යුතුවීම. | වත්කම් ආරම්භක ශේෂයන් වත්කම් වාර්තාවට ඇතුලත් කිරීමේ කටයුතු 2019 ජුනි 30 වන විට අවසන් කිරීමට කටයුතු කරන බව . |
| (ඇ) | මූල්‍ය නොවන වත්කම්වල 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,983,945,477ක් හා 2018 ජනවාරි 01 දිනට ශේෂය රු.2,783,345,426 ක් වූයෙන් රු.799,399,949 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඊට පැහැදිලිකිරීම් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමහ අදාළ තොරතුරු ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කළ යුතුවීම. | 2018 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවට ලබාදී තිබූ සටහන් වලට මෙම වෙනස්කම් පිළිබඳ කරුණු සටහන් කිරීමට අතපසු වූ බව. |
| (ඈ) | පොත්, සඟරා සහ ජර්නලවල ආරම්භක ශේෂය සඳහන් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මිළදීගැනීම් පමණක් සඳහන් කර තිබුණි. තවද, පුස්තකාල පොත් වාර්ෂික සංගණනය සිදුකර වාර්තා විගණනයට ඉදිරිපත් කර | වාර්ෂික සමීක්ෂණයන් නියමිත කාල පරිච්ඡේදය තුල සිදුකර වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම් ගත කළ යුතුවීම. | ආරම්භක ශේෂ CIGAS වැඩසටහනට ඇතුලත් කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර පුස්තකාල පොත් වාර්ෂික සංගණනය සිදුකර ඇත. එම වාර්තා |

| | | |
|---|---|---|
| නොතිබුණි. | | ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව . |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්කම්වල වටිනාකම රු.4,074,267 ක් වෙනුවට රු.1,516,536 ක් ලෙස දැක්වීම හේතුවෙන් මුදල්වල ශුද්ධ වෙනස්වීම රු. 2,557,731 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිවැරදිව පිළියෙල කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කළපසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 4.97 ක් හා සියයට 35.73 ක් විය | වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා ගන්නා ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුවීම. | පිළිතුරු ලබාදී නොමැත. |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සේවය හැරගිය නිලධාරීන් 16 කට අදාලව රු.790,809 ක් මියගිය නිලධාරීන් 05 කට අදාලව රු.404,642 ක් හා ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් 03 කට අදාළව රු.72,200 ක් වූ ණය ශේෂයන් පැවති අතර එම ණය ශේෂයන් තුල වසර 05 කට වඩා වැඩි කාලයක් තිස්සේ අය කර ගත නොහැකි රු.373,330 ණය ශේෂ පැවතිණි. | ණය ශේෂයන් අයකර ගැනිම සඳහා කටයුතු කළ යුතුවීම. | මෙම ණයශේෂ අයකරගැනීමට තොරතුරු සොයා බැලීමේ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතින බව. |

**2.3 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) තැන්පතු ගිණුමක 2018 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ 10 ක එකතුව වූ රු.4,967,342 ක් වර්ෂ 3 ක් ඉක්මවා තිබුණි. | පොදු තැන්පත් ගිණුම්වල දිගුකාලීනව පවතින ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුවීම. | අදාල ආයතන දැනුවත් කළ නමුත් අඩුපාඩු සකස්කිරීම සඳහා පියවර නොගත් නිසා එම අඩුපාඩු සකස් කර ගැනීම සඳහා නව ඇස්තමේන්තු කැඳවීම් සිදුකර ඇති බව. |
| (ආ) සහන පදනම මත දෙපාර්තමේන්තු නිලධාරීන්ට ලබාදෙනු ලැබූ යතුරු පැදි සඳහා ගෙවිය යුතු වූ රේගු ගාස්තු රු.8,766,108 ක් තැන්පතු ගිණුමක 2018 දෙසැම්බර් 31 දින වනවිටත් පැවති අතර එයින් රු.8,588,929 ක් වර්ෂ 01කට අධික කාලයක සිට පවතින ශේෂය විය. | පවතින ශේෂ නිරවුල් කළ යුතුවීම. | රේගු ගාස්තුව, රේගු දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂයට හරස් සටහන් මඟින් බැර කිරීමට හෝ මුදලින් ගෙවීමට මේ වන විටත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇති අතර අනුමැතිය ලද වහාම අදාල රේගු ගාස්තු නිදහස් කිරීම කරන බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පරික්ෂා කිරිමේදී පහත දැක්වෙන අවස්ථාවලදි කාලීන තොරතුරු ඉදිරිපත් කර නොතිබුණු බව නිරික්ෂණය විය.<br>• කර්මාන්ත අංශයේ හැසිරීම - 2015<br>• වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය - 2016<br>• වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2016 | දෙපාර්තමේන්තුවේ දැක්ම කාලීන තොරතුරු ලබාදීම බැවින් කාලීන තොරතුරු ලබාදීමට උත්සහ ගත යුතුවීම. | දත්ත වගු ගත කිරීම අවසන් කර තිබුණද කාර්යය සාධන වාර්තාව සකස් කරන අවස්ථාව වන විට අවසන් වාර්තා ප්‍රකාශයට පත් කර නොතිබුණු නිසා 2016 දත්ත වගු කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කළ බව. |

### 3.2 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සංශෝධිත ක්‍රියාකාරි සැලැස්ම අනුව වාර්ෂිකව සිදුකල යුතු සමීක්ෂණවල අවසන් වාර්තාව නිකුත් කළයුතු දිනයන් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් වාර්ෂික සමීක්ෂණ වාර්තා 03 ක් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් අවසන් කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම සකස්කිරිමේදී සමීක්ෂණවල අවසන් වාර්තාව නිකුත් කළයුතු දිනයන් නිශ්චිතව හඳුනාගත යුතුවීම. | සමීක්ෂණවල අවසන් වාර්තා නිකුත් කිරීමේදී යම් කාල පමාවක් සිදුවූ බව. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.17,330,000ක් වූ ධාවන තත්ත්වයේ නොමැති වාහන 5 ක් පැවති අතර ඉන් එක් වාහනයක් 2014 වර්ෂයේ සිට හා වාහන 3 ක් 2017 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණි. | ධාවනයට නුසුදුසු වාහන අපහරණය කළ යුතුවීම. | අපහරණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇප තැබිය යුතු නිළධාරීන් සම්බන්ධයෙන් මු.රෙ 880(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ඒ සම්බන්ධයෙන් දැනටමත් කටයුතු කරමින් පවතින බව. |

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිලධාරින් සඳහා නිකුත් කරන ලද වටිනාකම රු.317,466 ක්වු ටැබ්ලට් පරිගණක 04 ක් අස්ථානගතවී තිබුණද අලාභය අයකරගෙන නොතිබුණි. එම ඌණතාවය 2018 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් කර නොතිබුණි. | එම ඌණතාව අදාල පරිදි ලේඛනවල නිරූපනය කළ යුතුවීම හා අලාභය කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුවිම. | කොටස් වශයෙන් වැටුපෙන් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව හා ඉදිරියේදී භාණ්ඩ සමීක්ෂණය නිවැරදිව සිදුකිරීම සඳහා එම දිස්ත්‍රික් කාර්යාලවලට උපදෙස් දී ඇති බව. |

**3.6 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 වර්ෂයේ අනතුරකට ලක්වි තිබුණු වාහනයක් අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවන බව වාහනයේ දේශීය නියෝජිත සමාගම දන්වා තිබියදී 2015 වර්ෂයේදි අළුත්වැඩියා කර තිබුණි. අදාල වාහනය ධාවන තත්වයේ නොතිබුණු අතර 2018 දෙසැම්බර් වනවිටත් අලාභය අයකරගෙන නොතිබුණි. තවද, 2017 හා 2018 වර්ෂ වෙනුවෙන් රක්ෂණ වියදම් ලෙස පිළිවෙලින් රු.44,284ක් හා රු.50,999ක් වැය කර තිබුණි. | වාහන අනතුර සිදුවී වසර 5 ක් ගතවී ඇති බැවින් අලාභය අයකරගැනිමට කඩිනමින් කටයුතු කළ යුතුවීම. | රථය සම්බන්ධයෙන් සියළු කටයුතු සති දෙකක් තුළ අවසන් කර වාර්තාවක් ලබා දෙන ලෙස අතිරේක ලේකම් (පාලන) වෙත දැනුම් දී ඇති බවද, එහෙත් එම වාර්තාව මෙතෙක් ලැබී නොමැති බැවින් එම වාහනය පිළිබඳව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි වූ බව. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 24 ක් එනම් පුරප්පාඩු 442 ක් පැවතිණි. | තනතුරු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරිමට කටයුතු කළ යුතුවීම. | පුරප්පාඩු පිරවීමට අදාල කටයුතු කරමින් පවතින බව |